ඔපෙක් අරමුදලින් කොළඹ ජාතික මහා මාර්ග පුනරුත්ථාපනය කිරීම හා වැඩිදියුණුකිරීමේ ව්‍යාපෘතියේ 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ ජාත්‍යන්තර සංවර්ධනය සඳහාවූ ඔපෙක් අරමුදල අතර 2013 ජුනි 10 දින එළඹි අංක 1511පීබී දරන ණය ගිවිසුම සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුලත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

ව්‍යාපෘතියේ ණය ගිවිසුමට අනුව, එවකට වරාය, නාවික කටයුතු හා මහා මාර්ග අමාත්‍යාංශය වර්තමානයේ මාර්ග හා මහා මාර්ග අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර මාර්ග සංවර්ධන අධිකාරිය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. කොළඹ තදාසන්න ප්‍රදේශවල ප්‍රධාන මහා මාර්ග 13 ක කිලෝමීටර් 65.45 ක් වැඩිදියුණුකිරීම හා නාරාහේන්පිට නුගේගොඩ පාලම ප්‍රතිසංස්කරණය කිරීම ව්‍යාපෘතියේ අරමුණ වේ. ණය ගිවිසුම අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු. මිලියන 12,347.37 කට සමාන එ.ජ.ඩො. මිලියන 94.99 ක් වන අතර ඉන් රු. මිලියන 6,499.57 කට සමාන එ.ජ.ඩො.මිලියන 50 ක් සැපයීමට ජාත්‍යන්තර සංවිධානය සඳහා වූ ඔපෙක් අරමුදල එකඟ වී තිබුණි. ව්‍යාපෘතිය එහි කටයුතු 2013 දෙසැම්බර් 11 දින ආරම්භ කරන ලද අතර 2017 දෙසැම්බර් 31 වන විට නිම කිරීමට නියමිත විය. කෙසේවෙතත් ව්‍යාපෘතියේ කටයුතු 2020 දෙසැම්බර් 31 දක්වා දීර්ඝ කර තිබුණි.

## 1.3 මතය

ව්‍යාපෘතියේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ක්‍රියාකාරිත්වය හා එහි මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.4 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලැසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දූස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලැසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- භාවිතා කරන ලද ගිණුම්කරන ප්‍රතිපත්තිවල සහ ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාවය අගයන ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක්කළ අතර, ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දූර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

## 2. භෞතික කාර්යසාධනය

### 2.1 ව්‍යාපෘතියේ කටයුතු පිළිබඳ භෞතික ප්‍රගතිය

කොන්ත්‍රාත් පැකේජ 07 ක් යටතේ ක්‍රියාත්මක කොළඹ දිස්ත්‍රික්කයේ ජාතික මාර්ගවල කිලෝමීටර් 63.72 ක් සහ නාරාහේන්පිට - නුගේගොඩ මාර්ගයේ පාලම් අංක 2/1 පුනරුත්ථාපනය සහ වැඩිදියුණු කිරීමෙන් ව්‍යාපෘතියේ විෂය පථය සමන්විත වේ. 2013 දෙසැම්බර් 11 දින මාර්ග පුනරුත්ථාපන කටයුතු ආරම්භ කර තිබුණු අතර 2017 දෙසැම්බර් 31 දින වන විට අවසන් කිරීමට සැලස්ම් කර තිබුණද 2018 දෙසැම්බර් 31 දින වන විට ජාතික මාර්ග 05 ක කිලෝමීටර් 12.77 ක පුනරුත්ථාපන කටයුතු සහ පාලමේ වැඩිදියුණු කිරීමේ කටයුතු අවසන් කර තිබුණි. පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන ගැටළුව | බලපෑම | කළමනාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|---|
| (අ) | 2018 දෙසැම්බර් 31 දිනට කොට්ටාව - තලගල මාර්ගය, කොට්ටේ - බෝපේ මාර්ගය සහ ඔරුගොඩවත්ත - අඹතලේ මාර්ගයේ පුනරුත්ථාපන කටයුතුවල භෞතික ප්‍රගතිය සියයට 45 වඩා අඩුවෙන් පැවතුණි. | පුනරුත්ථාපන කටයුතු සම්පූර්ණ කිරීමට කාලය ගත වීම හේතුවෙන් කොන්ත්‍රාත්තුවල පිරිවැය ඉහළ යාමට හැකියාව පවතී. | ඉඩම් අත්පත් කරගැනීමේ ප්‍රමාදයන් හේතුවෙන් කොට්ටාව - තලගල සහ කොට්ටේ - බෝපේ මාර්ගවල ප්‍රගතිය සැලසුම්වලට පිටුපසින් පවතී. කොන්ත්‍රාත්කරුවන්ගේ ප්‍රමාදයන් උපයෝගීතා හුවමාරු කිරීමේ ප්‍රමාදයන් සහ ඉඩම් අත්පත් කරගැනීමේ ප්‍රමාදයන් හේතුවෙන් ඔරුගොඩවත්ත - අඹතලේ මාර්ගයේ ප්‍රගතිය සැලසුම්වලට පිටුපසින් පැවතුණි. | ඉලක්කගත දිනයට නිම කිරීමට ව්‍යාපෘතියේ මාර්ග පුනරුත්ථාපන කටයුතුවල විෂය පථය සැලසුම් කිරීම අවශ්‍ය වේ. |
| (ආ) | ඔරුගොඩවත්ත - අඹතලේ මාර්ගයේ පුනරුත්ථාපන කටයුතු සඳහා කොන්ත්‍රාත්තුව 2017 ජූලි 01 දින රු.මිලියන 1,528 ක පිරිවැයකට ප්‍රදානය කර තිබූ අතර කොන්ත්‍රාත්කරු විසින් ක්‍රියාත්මක කරන පුනරුත්ථාපන කටයුතුවල මන්දගාමී ප්‍රගතිය නොසලකා කොන්ත්‍රාත්තුවේ කාලය දින 175 ක් දීර්ඝ කර තිබුණි. කෙසේවෙතත්, කොන්ත්‍රාත්කරුට එරෙහිව දඩ පැනවීමේ හැකියාව සැලකීමකින් තොරව 2018 ඔක්තෝබර් 18 දින සිට බලපැවැත්වෙන පරිදි ව්‍යාපෘතිය විසින් කොන්ත්‍රාත් ගිවිසුම අවසන් කර තිබුණි. | කොන්ත්‍රාත්වල පිරිවැය ඉහළ යාමට ඉඩ ඇත. | 2019 ඔක්තෝබර් 01 දින ඔරුගොඩවත්ත - අඹතලේ මාර්ගයේ පුනරුත්ථාපන කටයුතු සඳහා නව කොන්ත්‍රාත්තුවක් පිරිනමා ඇත. නාවින්න - බොරලැස්ගමුව මාර්ගය වැඩිදියුණු කිරීම සඳහා ණය මුදලෙහි ප්‍රමාණවත් ප්‍රතිපාදන නොමැත. | අමතර පිරිවැය අවම කර ගැනීමට පියවර ගැනීමට අවශ්‍ය වේ. |
| (ඇ) | ඉඩම් අත්පත් කරගැනීමේ ප්‍රමාදයන් හේතුවෙන් 2019 නොවැම්බර් 30 දින වන විටත් අනෙකුත් මාර්ගවල කිලෝමීටර් 19.20 ක් පුනරුත්ථාපන කටයුතු ආරම්භ කර නොතිබුණු අතර ව්‍යාපෘතියේ විෂය පථයෙන් නාවින්න- බොරලැස්ගමුව | -එම- | ඉඩම් අත්පත්කර ගැනීමේ ප්‍රමාදයන් හේතුවෙන් පිළියන්දල - මහරගම මාර්ගයේ සහ වල්ගම - දියගම මාර්ගයේ පුනරුත්ථාපන කටයුතු ආරම්භ කර නොතිබුණි. | -එම- |

මාර්ගයේ කිලෝමීටර් 2.41 ක පුනරුත්ථාපන කටයුතු අවලංගු කර තිබුණි.

## 2.2 මූල්‍ය සම්පත් ඌනඋපයෝජනය

| විගණන ගැටළුව | බලපෑම | කළමනාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|
| ණය ගිවිසුමට අනුව, රු.මිලියන 6,499.57 කට සමාන එජඩො මිලියන 50 ක් ප්‍රතිපාදනය කර තිබූ අතර ඉන් 2018 දෙසැම්බර් 31 දිනට සියයට 39.62 නියෝජනය කරන රු.මිලියන 3,005.22 කට සමාන එජඩො මිලියන 19.81 පමණක් උපයෝජනය කර තිබුණි. කටයුතුවල සහ අරමුදල් උපයෝජනයේ මන්දගාමී භෞතික ප්‍රගතිය හේතුවෙන් 2017 දෙසැම්බර් 31 දින අවසන්වීමට නියමිතව තිබූ ණය කාලසීමාව 2020 දෙසැම්බර් 31 දක්වා දීර්ඝ කර තිබුණි. | බැඳීම් ගාස්තු මත අමතර පිරිවැය දැරීමට හැකියාව පවතී. | එකඟ වේ. | ණය කාලසීමාව ඉකුත්වීමට පෙර ප්‍රතිපාදන උපයෝජනය කිරීමට මූල්‍ය සැලැස්ම දැඩිව අධීක්ෂණය කිරීම අවශ්‍ය වේ. |

## 2.3 ඉඩම් අත්පත් කරගැනීම පිළිබඳ ගැටළු

| විගණන ගැටළුව | බලපෑම | කළමනාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|
| ලැබී තිබුණු තොරතුරු අනුව, රජය සතු ඉඩම් කොටස් 1,153 ක් ඇතුළුව ඉඩම් කොටස් 5,341 ක් අත්පත් කර ගැනීමට සැලසුම් කර තිබුණි. ඉන් 2018 දෙසැම්බර් 31 දිනට ඉඩම් අත්පත් කර ගැනීමේ පනතේ 17 වන වගන්තිය යටතේ ඉඩම් කොටස් 1,454 ක් සඳහා රු.මිලියන 3,210 ක් වන්දි මුදල් ගෙවා තිබුණි. කෙසේ වෙතත්, 2018 දෙසැම්බර් 31 දිනට ඉඩම් අත්පත් කර ගැනීමේ පනතේ 44 වන වගන්තිය යටතේ ඉඩම් කොටස් 04 ක් පමණක් ලියාපදිංචි කර තිබුණි. තවද, වන්දි මුදල් නිරවුල් කිරීමේ ප්‍රමාදයන් හේතුවෙන් සමාලෝචිත වර්ෂය තුළදී රු.මිලියන 75.72 ක පොළී මුදලක් ගෙවා තිබුණි. | වන්දි මුදල් නිරවුල් කිරීම මත පොළී ගෙවීම මත අමතර පිරිවැයක් දැරීමට ඉඩ ඇත. | පොළී ගෙවීමෙන් පසු ඉතිරි කොටස් ලියාපදිංචි කිරීමට පියවර ගනු ලැබේ. | ඉඩම් අත්පත් කරගැනීමේ කටයුතු මනාලෙස සැලසුම් කළ යුතු අතර ඉලක්කගත දිනයන්ට අවසන් කිරීමට කටයුතු කළ යුතුය. |

## 2.4 මානව සම්පත් කළමනාකරණය

| විගණන ගැටළුව | බලපෑම | කළමනාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|
| ව්‍යාපෘතියේ අනුමත කාර්ය මණ්ඩලය තනතුරු 24 කින් සමන්විත වන අතර ව්‍යාපෘති ලේකම් නියෝජ්‍ය, ව්‍යාපෘති අධ්‍යක්ෂ, නැවත පදිංචි කිරීමේ නිලධාරී, ප්‍රවාහන පද්ධති විශ්ලේශක වැනි ප්‍රධාන විධායක තනතුරු 2018 දෙසැම්බර් 31 දිනට වර්ෂ 02 ක් පුරා පුරප්පාඩුව පැවතුණි. | ව්‍යාපෘති කටයුතුවල කාර්යසාධනයට අවාසි සහගත ලෙස බලපානු ඇත. | අදහස් දක්වා නොමැත. | ව්‍යාපෘතියේ කටයුතු සුමට ආකාරයට ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය සුදුසුකම් සහ දක්ෂතාවයක් සහිත කාර්යමණ්ඩලය බඳවා ගැනීමට අවශ්‍ය වේ. |